143

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)
උපාධි වැඩසටහන 2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**SNU5341/ ESU3141- අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය**
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.01.26 වේලාව -පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>01 - කොටස</u>

01. අධ්‍යාපන මාර්ගෝපදේශනය සහ අධ්‍යාපන උපදේශනය අතර ඇති වෙනස්කම් තුනක් (03) කෙටියෙන් සඳහන් කරන්න.

02. සිතුවිලි, හැඟීම් සහ හැසිරීම් අතර සම්බන්ධය අවබෝධ කර ගැනීමේ දී ඇල්බට් එලිස්ගේ තාර්කික චිත්තවේගීය චර්යා චිකිත්සාවේ (REBT) ABC ආකෘතියේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ආරක්ෂිත ගෞරවනීය සහ ඵලදායී උපදේශන සබඳතාවක් සහතික කිරීම සඳහා උපදේශකයින් විසින් අනුගමනය කල යුතු සච්චාරිත්‍ර ධර්ම හතරක් (04) නම් කරන්න.

04. දෙමාපියන්ගේ හැසිරීම දරුවකුගේ පෞරුෂ වර්ධනයට වැදගත් වන ආකාරය බැන්ඩුරාගේ සමාජ ඉගෙනුම් න්‍යාය ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න.

05. ළමුන්ගේ චර්යාමය ගැටළුවලට බලපාන සාධක හතරක් (04) නම් කර ඉන් එක් සාධකයක් සුදුසු උදාහරණයක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ඈන් රෝ (Anne Roe) ගේ වෘත්තීය උපදේශන න්‍යාය දෙමාපිය උපදේශනය ලබා දීමේදී වැදගත්වන ආකාරය විස්තර කරන්න.

07. පන්තිකාමරයේදී නිරීක්ෂණය කල හැකි දරුවන් තුළ දක්නට ලැබෙන හැසිරීම් ගැටළු පහක් (05) සඳහන් කරන්න.

08. "සුභග දූර්වල සාධනයක් සහිත ළමුන්" යන යෙදුම පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)



63

## 02- කොටස

09. (i.) එලී ගින්ස්බර්ග්ගේ වෘත්තීන් තේරීම පිළිබඳ න්‍යායෙහි එන ප්‍රධාන වෘත්තීය තේරීම් අවධි තුන (03) නම් කරන්න. (ලකුණු 03)

(ii.) වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනයෙහි ප්‍රධාන අරමුණු පහ (05) සඳහන් කර ගුරුවරයකු වශයෙන් ඔබට මෙම අරමුණු පිළිබඳ දැනුවත් භාවය වැදගත් වන්නේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) ආබාධ සහිත දරුවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය ලබා දීමේදී ගුරුවරයෙක් වශයෙන් ඔබ විසින් සලකා බලන මූලික කරුණු මොනවාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i.) "සමායෝගය" යන පදය සුදුසු උදාහරණයක් ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(ii.) දරුවන් සහ නව යෞවනයන්ගේ පෞරුෂ සමායෝගයට බාධා කරන සාධන තුනක් (03) නම් කර , එක් සාධකයක් නිදසුන් දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට ඵලදායී ලෙස සමායෝගී වීම සඳහා යොදා ගත හැකි නිර්මාණශීලී උපාය මාර්ග තුනක් (03) යෝජන කර ඉන් එක් උපායමාර්ගයක් සැලසුම් කිරීම සඳහා පියවරෙන් පියවර මාර්ගෝපදේශයක් සපයන්න. (ලකුණු 10)

11. "විශේෂයෙන්ම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ චර්යා හැඩගැස්වීමට සහ යහ පැවැත්මට පාසලෙහි චිත්තවේගීය වාතාවරණය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි."

(i.) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් අතර ධනාත්මක චර්යා ප්‍රවර්ධනය කිරීමෙහිලා පාසලෙහි චිත්තවේගීය වාතාවරණයෙහි කාර්යභාරය කෙසේ විය යුතුදැයි පෙන්වා දෙන්න. (ලකුණු 05)

(ii.) ආබාධ සහිත දරුවන්ගේ අභියෝගාත්මක චර්යා කළමනාකරණය කර ගැනීමේදී ශ්‍රී ලංකාවේ ගුරුවරුන් මුහුණ දෙන බාධක තුනක් (03) සඳහන්කර, ඒවා පන්තිකාමර කළමනාකරණයට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) ඉහත ඔබ විසින් දක්වන ලද බාධක අතරින් එක් බාධකයක් තෝරාගෙන එම බාධාව අවම කිරීමට ඔබට ලබා දිය හැකි යෝජනා මොනවාදැයි සුදුසු නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 09)

12. "කාල් රොජර්ස්ගේ පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශය තුළින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ චිත්තවේග වෙනස්කම් වලට ආමන්ත්‍රණය කළ හැකිය."

(i.) මෙම කියමනට ඔබ එකඟවන්නේද? නොවන්නේද? ඔබේ පිළිතුර සාධාරණීය කරන්න. (ලකුණු 05)

(ii.) ආබාධ සහිත සිසුන්ට පාසලින් වැඩලොවට සාර්ථක ලෙස සංක්‍රමණය වීම සඳහා මාර්ගෝපදේශන හා උපදේශන සේවාව සහාය විය හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii.) විශේෂ අවශ්‍යතා සහිත සිසුන් පාසලින් වැඩලොවට සංක්‍රමණය වීමේදී මුහුණ දෙන ප්‍රධාන අභියෝග තුනක් **(03)** සඳහන් කර ඒවා මගහරවා ගැනීමට ගුරුවරයෙක් වශයෙන් ඔබ විසින් ඉදිරිපත් කරන යෝජනා මොනවාදැයි පෙන්වා දෙන්න. (අවම වශයෙන් යෝජනා දෙකක් **(02)** වත් ඇතුලත් විය යුතුය.)

(ලකුණු 09)

13. "සමාජයේ සිදුවන වෙනස්වීම් සමග පාසල් මාර්ගෝපදේශන සහ උපදේශන සේවාවන්හි අවශ්‍යතාව ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී."

(i.) ගුරුවරයෙක් වශයෙන් ඔබට පාසල් මාර්ගෝපදේශන සහ උපදේශන සේවාවේ යාවත්කාලීන වීම් පිළිබඳ දැනුවත්භාවය අවශ්‍යවන්නේ මන්දැයි සුදුසු නිදසුන් දෙකක් **(02)** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 03)

(ii.) පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවා ක්‍රියාත්මක කිරීමේදී පාසල් විසින් මුහුණ දෙන අභියෝග තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 08)

(iii.) ඉහත අභියෝග මගහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 09)

14. (i.) අධික ලෙස ඩිජිටල් තිර නැරඹීම සඳහා ඇබ්බැහි වූ දරුවකු තුළ දැකිය හැකි අභියෝගාත්මක චර්යාමය ලක්ෂණ තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 03)

(ii.) අධික ලෙස ඩිජිටල් තිර නැරඹීමට යොමුවීම දරුවන්ගේ කායික, මානසික, සමාජයීය සහ අධ්‍යාපනික සංවර්ධනයට බලපාන්නේ කෙසේද යන්න එක් එක් ක්ෂේත්‍රය යටතේ උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) ඔබගේ පන්තිකාමරයේ සිටින විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කිහිපදෙනෙකු අධික ලෙස ඩිජිටල් තිර නැරඹීමට ඇබ්බැහි වී ඇතැයි උපකල්පනය කරමින්, එම තත්ත්වයෙන් දරුවන් මුදවා ගැනීමට ඔවුන්ගේ දෙමාපියන්ද ඵලදායි ලෙස සම්බන්ධ කරගනිමින්, අවම වශයෙන් උපාය මාර්ග තුනක් **(03)** සහිත සැලැස්මක් සකස් කරන්න. එම උපාය මාර්ග ඔබ ක්‍රියාත්මක කරන ආකාරය විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 09)

***-සියලුම හිමිකම් ඇවිරිණි.-***